# 20 බොදු පුනරුදයේ සෙන්පතියාණෝ



19 වන සියවස අග භාගයේ මෙරට ඇති වූ ජාතික පුනරුදයට දායක වූ පිරිස අතර භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ වූහ. විවිධ වෙනස්කම්වලට බඳුන් වෙමින් පැවති සමාජ පසුබිමක බුද්ධ ශාසනයේ පැවැත්ම හා බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීම උදෙසා උන් වහන්සේ කළ කැප වීම ඉමහත් ය. එසේ කැප වූ ගුණ නැණ බෙලෙන් යුතු උතුමන්ගේ චරිත හැදෑරීමෙන් අපට රසවත් ජීවන අත්දැකීම් මෙන් ම හරවත් ජීවන ආදර්ශ ද ලබා ගත හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පටු පාර දිගේ වේගයෙන් ගමන් කරන අශ්ව කරත්තයකි. අශ්ව කුර නාදය හාත්පස පැතිරෙයි. ඉදිරියෙන් එන ගොන් කරත්තය ගාටමින් ඉදිරියට ඇදෙයි. අශ්ව කරත්තයට ගමන් කිරීමට ගොන් කරත්තය පාරෙන් ඉවතට ගත යුතු ය. එවන් සූදානමක් නැති බව අශ්ව කරත්තයේ සිටි මිගෙල් නම් බලවත් ක්‍රිස්තියානි මුදලිතුමාට හැඟී ගියේ ය. කෝපය ද මානය ද ඇති ව, ඔහු "කවුද මේ මහ ජගතා" යි තමාට ම කියා ගත්තේ කරත්තයෙන් බසිමිනි. ගොන් කරත්තය දක්කන්නා බියෙන් වෙවුලයි. කුමකින් කුමක් වේ දෝ යි ඔහු විපිළිසර වෙයි. කරත්තයේ සිටියේ දහම් දෙසුමකට වඩිමින් සිටි හාමුදුරුනමකි.

"දන්නව ද, මම කවුද කියලා? මම තමා මිගෙල්" යැයි දැඩි ස්වරයෙන් කියා සිටියේ මුදලිතුමා ය. එවිට තමාගේ ගිහි කල නම සිහි කළ හාමුදුරුවන් වහන්සේ සිනා පහළ කරමින්,

"දන්නව ද, මම කවුද කියලා? මමත් මිගෙල්" යි ඉතා දැඩි ස්වරයෙන් පැවසූහ. හාමුදුරුවන් වහන්සේ තමන්ට සමච්චල් කරනවා දැයි මුදලිතුමාට සිතුණි. මුදලිතුමා කෝපයෙන් පිපිරෙන්නට විය. එවිට හාමුදුරුවන් වහන්සේ ඉතා ශාන්තව මෘදු ස්වරයෙන්,

"කේන්ති ගන්න එපා උපාසක උන්නැහේ" යි පවසා තමා කවරෙක් දැ යි මෘදු ස්වරයෙන් හෙළි කළ සේක.

ඒ හිමියන් කවරෙක් දැ යි ඔබට අනුමාන කළ හැකි ද? ඒ අන් කිසිවකු නො ව යටත්විජිත සමයේ බුදු සසුනේ පැවැත්ම උදෙසා උදා වූ බොදු පුනරුදයේ පහන්ටැඹක් වූ වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණෝ ය.

මුදලිතුමා උන් වහන්සේ ගැන තොරතුරු අසා තිබුණු බැවින් වැඩි දුර කතා කළේ නැත. පහන් සිතින් උන් වහන්සේට ඉමහත් ගරුසරු ඇතිව ගමනාන්තය තෙක් තනියට ද ගියේ ය. දෙදෙනා අතර වචනයෙන් හෝ ගැටුමක් විය හැකි අවස්ථාවක් තැනට සුදුසු පරිදි ක්‍රියා කිරීම නිසා සුහද අවස්ථාවක් බවට පත් අයුරු අපූරු ය.

මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් උපත ලැබුවේ 1823 පෙබරවාරි මස නව වැනි දින බලපිටියේ මොහොට්ටිවත්තේ දී ය. උන් වහන්සේගේ ගිහි කල නම වූයේ ගිංගම ලද්දු මිගෙල් මැන්දිස් ය. ගිංගම ලද්දු අසනේරිස් මැන්දිස් මහතා පියා ය. මව මිල්ඩෝ ද සිල්වා මැතිනිය යි. කුඩා මිගෙල් ඉගෙනීමෙහි දක්ෂ වූ අතර කතාවෙහි චතුර බව විශේෂ චරිත ලක්ෂණයක් විය.

එකල මොහොට්ටිවත්ත ගම් පියසේ හෝ ඒ ආසන්නයේ හෝ රජයේ පාසලක් නො තිබිණි. එහෙයින් කුඩා මිගෙල් අකුරු කරන්නට ගියේ ගමේ පිහිටි ක්‍රිස්තියානි දේවස්ථානයට ය. එහි දී පූජකවරයකුගේ මග පෙන්වීම යටතේ මේ දරුවාට ඉතා හොඳින් සිංහල මෙන්

ම ඉංගිරිසි භාෂා දැනුම ද ලබා ගන්නට හැකි විය. ජීවන ගමනේ විසි වස පිරෙද්දී මේ තරුණයාට අවැසි වූයේ පල්ලියේ පූජකවරයක් ලබා ගන්නට ය. ඒබ්‍රහම් ද අල්විස් නමැති බලපිටියේ මහමුදලිඳුගේ ආධාර උපකාර ඇතිව කොළඹ වෙස්ලි විදුහලට ඇතුළත්ව වැඩිදුරටත් ඉංගිරිසි භාෂාව හැදෑරීමට ද මිගෙල් තරුණයාට අවස්ථාව සැලසුණි. දැනුම් පිපාසයෙන් පෙළුණු ඔහුට වෙස්ලි විදුහල දැනුම් සයුරේ පිහිනන්නට මනා සවියක් විය.

බලපිටියේ සුධර්මාරාමවාසී ශ්‍රී ගුණරතන තෙරුන් වහන්සේ යටතේ ශාස්ත්‍ර හැදෑරූ තරුණ මිගෙල් සිංහල, පාලි, සංස්කෘත හා බුද්ධ ධර්මය මැනවින් ප්‍රගුණ කරමින් එකල බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පමණක් තිබූ දුර්ලභ හැකියාවක් වූ පුස්කොළ ග්‍රන්ථ සම්පාදනයේ හැකියාව ද ලබා ගත්තේ ය.

මිගෙල් තරුණයා ට දොඩන්දූව කුමාර මහා විහාරස්ථානයේ පැවැති පින්කමක් දැක බලා ගන්නට අවස්ථාවක් ලැබිණි. ඔහු පන්සලේ කිහිප දිනක් නතරව පින්කමේ කටයුතුවලට සහයෝගය දුන්නේ ය. එහි දී මිගෙල් තරුණයාට බුදු දහම පිළිබඳ ඇති පැහැදීම වැඩිදියුණු විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ ඔහු කුමාර මහා විහාරයේ අධිපති ගරු තෙලිකඩ හාමුදුරුවන් වහන්සේ යටතේ මොහොට්ටිවත්තේ ගුණානන්ද නමින් පැවිදි දිවියට ඇතුළත් වීම ය. පැවිදි වූ දිනයේ දී ම ඒ හිමියෝ තුන්යම් රෑ පුරා මාහැගි දහම් දෙසුමක් පැවැත්වූහ. එම දහම් දෙසුම බොදු දන පහන් සිත් වඩන්නට හේතු විය.

"මොකක් ද පොඩි නම ඔය කියවන පොත?" දිනක් ලොකු හාමුදුරුවන් විමසුවේ ගුණානන්ද පොඩි හාමුදුරුවන්ගෙනි.

"ක්‍රිස්තියානි ධර්මය" යි පොඩි හාමුදුරුවන් පිළිතුරු දුන්නේ ඉතා සන්සුන් ලෙසිනි.

"පොඩි නමට පිස්සු ද?"

"ඇයි, ලොකු හාමුදුරුවනේ?"

"අපි බුද්ධපුත්‍රයෝ, ඉතින් මොකට ද ඔය අන්‍යාගමික පොත් කියවන්නේ?"

"ලොකු හාමුදුරුවනේ, අවසරයි. මං මේ හදන්නේ ක්‍රිස්තියානි ආගම අදහන්න නො වෙයි. මේ ආගම මොකද්ද කියලා දැන ගන්න යි, එහෙම දැන ගෙන ඉන්න එක හොඳයි නේද?"

ලොකු හාමුදුරුවන් වහන්සේ නිහඬ වූයේ තම ගෝල හිමිගේ නැණවත් බව පිළිබඳ තුටු සිතිනි.

දුර දක්නා නුවණින් යුතුව සමය සමයාන්තර දැනුම පුළුල් කර ගැනීමට උන් වහන්සේ

කැප වූ ආකාරය අගනේ ය. බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තකු වීමේ පෙර මග ලකුණු සැබැවින් ම ගුණානන්ද හිමියන් වෙතින් මුල සිට ම දිස් විය.

1832 බිහි වූ කොටහේනේ දීපදුත්තමාරාමයට වැඩම කළ ගුණානන්ද හිමියෝ ධර්ම දේශන පැවැත්වීම, පෙරහැර සංවිධානය ආදිය මගින් බෞද්ධ පුනර්ජීවනයට අවශ්‍ය මග සැලසූහ. වසර 1844 දී උපසම්පදාව ලැබූ උන් වහන්සේ ඒ වන විට පාලි, සංස්කෘත, සිංහල, ඉංගිරිසි යන භාෂා මැනවින් ප්‍රගුණ කොට තිබුණි. ගුණානන්ද හිමියන්ගේ ප්‍රමුඛත්වයෙන් 1848 දී පිහිට වූ බෝධිරාජ සමිතිය මගින් බෝධි වෘක්ෂ රෝපණය කොට බෞද්ධ ජනයාට වැඳුම් පිදුම් සඳහා අවශ්‍ය පරිසරය උදා කර දිනි. කොළඹ හා තදාසන්න පෙදෙස්වල බෞද්ධ වෙහෙර විහාර නොතිබූ අවධියක් බැවින් බෝධිරාජ සමිතියෙන් සිදු වූ මෙහෙවර බෞද්ධ ආගමික ප්‍රබෝධයට හේතු විය. ඕනෑ ම කටයුත්තක් සැලසුම් සහගතව සංවිධානය කිරීමට ගුණානන්ද හිමියන්ට තිබූ හැකියාව සියලු දෙනාගේ ඇගයීමට ලක් විය. බුදු දහම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට කැප වූ උන් වහන්සේ **ක්‍රිස්තියානි වාද විඝාතනිය, සත්‍ය මාර්ගය, රිවිරැස, බුද්ධ ඇඳහිල්ල** වැනි පොත් පත් ද රචනා කළහ.

බුදු දහමට එල්ල වූ අභියෝගවලට මුහුණ දීම සඳහා ප්‍රසිද්ධ වාද මාලාවක් පැවැත්වීමට ද ගුණානන්ද හිමිපාණෝ ක්‍රියා කළහ. වාදීභසිංහ යන නාමය උන් වහන්සේට ලැබුණේ ඒ එම වාද ජයග්‍රහණය කිරීමෙහිලා දැක්වූ දක්ෂතා හේතු කොට ගෙන ය. 1865 බද්දේගම දී ද 1865 කැලණියේ වරාගොඩ දී ද 1866 උදම්මිට දී ද 1871 ගම්පොළ දී ද 1873 පානදුරේ දී ද බෞද්ධ - ක්‍රිස්තියානි දෙපිරිස අතර ප්‍රසිද්ධ වාද ඇති විය. පංචමහාවාද යනුවෙන් හැඳින්වෙන මේ වාද මාලාවේ සෑම වාදයක ම ප්‍රධාන කථිකයා වූ ගුණානන්ද හිමිපාණන් සතු සමයාන්තර දැනුමත් තර්ක ඥානයත් වාග්චාතුර්යයත් ප්‍රකට විය. එම වාද අතරින් පානදුරා වාදය බුදු දහම විදේශවල පවා ප්‍රචලිත වීමට හේතු විය. බුදු සමය වෙනුවෙන් අපරිමිත මෙහෙවරක යෙදුණු අමෙරිකානු ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් මහතා ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූයේ පානදුරා වාදය යි. ප්‍රතිවාදීන්ගේ ප්‍රබලත්වය පිළිබඳ අවබෝධයෙන් සිටි දායක මහතෙක් ගුණානන්ද හිමියන් පානදුරා වාදයට සූදානම් වෙද්දී මෙසේ පැවසී ය.

"හාමුදුරුවනේ, අවසර යි. මේ තීරණය ගත්තේ හොඳට හිතලා මතලා නේද?"

"ඇයි, උපාසක මහත්තයෝ එහෙම ඇහුවේ?" ගුණානන්ද හිමියෝ සිනා පහළ කරමින් ඇසූහ.

"ඒ අයට ඉංගිරිසි ආණ්ඩුවේ අනුග්‍රහයත් තියෙනවා නේද?."

"ඉතින්, අපි කරන්නේ විවාදයක් නො වැ, අතින් පයින් කරන සටනක් යැ, කටින් කරන සටනක් නො වැ."

උන් වහන්සේ කෙතරම් සංයමයකින් තම මතය තහවුරු කරන්නට උත්සාහ කළා ද යන්න මින් පැහැදිලි ය. තම අදහස් සනාථ කිරීමට උන් වහන්සේ භාවිත කළේ බුද්ධිය මුල් කොට ගත් වැඩපිළිවෙළකි.

එකිනෙකාගේ අදහස්වලට සාවධානව ඇහුම්කන් දෙන හා ගරු කරන පොදු ජනතාවක් බිහි වීම මෙම වාදවලින් සිදු වූ වැදගත් සමාජ මෙහෙවරකි. කියවීම, ලිවීම වැනි කටයුතු කෙරෙහි පොදු ජනතාව යොමු වීමට ද මේ තත්ත්වය විශේෂයෙන් හේතු විය. 1865 බද්දේගම දී ඇති වූ වාදය මුළුමනින් ම ලිපි හුවමාරුවකින් සිදු වූවකි. ඉංගිරිසි ආණ්ඩුව තම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා භාවිත කළ මුද්‍රණ ශිල්පය බෞද්ධ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගන්නට ගුණානන්ද හිමියන් ප්‍රමුඛ පිරිස සමත් වීම දිවයිනේ සංස්කෘතික ඉතිහාසයේ ඉතා වැදගත් පියවරකි. කියවීම එතරම් ජනප්‍රිය නොවූ සමයක ගුණානන්ද හිමියන්ගේ අදහස් දැන ගැනීමට බෞද්ධ - අබෞද්ධ බොහෝ දෙනා යොමු වූහ. මෙරට නව ශාස්ත්‍රීය පරිසරයකට අවශ්‍ය පදනම ද මේ මගින් ශක්තිමත් විය.

ගුණානන්ද හිමියන් බෞද්ධ අධ්‍යාපනයට කළ මෙහෙය අපමණ ය. බෞද්ධ පාසල් පිහිටුවීමට පෙරමුණ ගත්තේ උන් වහන්සේ ය. මේ හිමියන්ගේ ද උපදේශකත්වය යටතේ ඕල්කට් තුමා ඇතුළු පිරිස විසින් පිහිටුවූ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම, මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණ ආදිය එහිලා ඉතා වැදගත් ය. කොළඹ පිහිටුවන ලද ප්‍රථම බෞද්ධ පාසලට සුදුසු නමක් යෙදීම සම්බන්ධයෙන් ඕල්කට් තුමා ඇතුළු පිරිස ගුණානන්ද හිමියන්ට යෝජනා කළේ එම පාසල ශ්‍රී ගුණානන්ද ලෙස නම් කිරීමට ඊට සහයෝගය දුන් සියලු දෙනා කැමැත්ත ප්‍රකාශ කළ බව යි.

"මම මේ තරම් සේවාවක් කළේ මගේ නම් ගම් තැන තැන අටවා ගන්න නො වෙයි. කරුණාකරලා ඔය අදහස අත්හැර ගනිමු. මට කීර්ති ප්‍රශංසා ඕනෑ නෑ. මං ඒවා බලා ගෙන වැඩ කරන්නෙත් නෑ" යි උන් වහන්සේ ඉතා සන්සුන්ව පැවසූහ. මින් ගුණානන්ද හිමියන් ආත්මාර්ථයෙන් තොරව සිදු කළ සමාජ මෙහෙවර හා අනතිමානී බව පිළිබිඹු වේ. සිය සැපත නො තකා අන් සැපත වෙනුවෙන් දිවි කැප කළ උන් වහන්සේ බුදු දහමේ දියුණුව ම එක සිතින් පැතූහ. කෙසේ වුව ද උන් වහන්සේගේ නමේ අග කොටස යොදා අදාළ විදුහල නම් කිරීමට කටයුතු යෙදිණි. ඒ විදුහල නම් කොළඹ ආනන්ද විදුහල යි.

මෙලෙසින් ස්වකීය චරිත ශක්තියෙන් ධර්ම ඥානයෙන් හා වාග් චාතුර්යයෙන් නිසි ඵල ලබා ඉමහත් ශාසනික හා සමාජ මෙහෙවරක නිරත වූ මේ ශ්‍රේෂ්ඨ බුද්ධ පුත්‍රයාණන් වහන්සේ 1890 සැප්තැම්බර් 21 දින සකල බෞද්ධ ජනතාව ම සෝ සයුරේ ගිල්වමින් අපවත් වී වදාළහ. ඒ වන විට බෞද්ධ පුනරුදය උදෙසා උන් වහන්සේගේ ප්‍රතිපත්ති අනුගමනය කරන සුවිසල් ගිහි-පැවිදි පිරිසක් බිහි වී සිටීම මගින් සාධනය වන්නේ උන් වහන්සේගේ පරාර්ථ චර්යාවේ සඵල භාවය යි.

ගුණානන්ද හිමියෝ තර්ක ඥානයෙන් තීක්ෂණ හ; ස්ථානෝචිත ප්‍රඥා ඇතිව අචකිතව ප්‍රතිවාදීන්ට මුහුණ දුන්හ. නො සැලෙන ගුණයෙන් ඉන්ද්‍රඛීලයක් වැනියහ. පක්ෂ විපක්ෂ සියලු දෙනා අභිමුව උන් වහන්සේගේ ගම්භීර වාග්ධාරාව රාව ප්‍රතිරාව දුන්නේ අභීත සිංහ නාදයක් ලෙසිනි. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ උදාර ගුණාංග අනුගමනය කිරීමට අධිෂ්ඨාන කර ගැනීමත් තමන්ට සහජයෙන් ලැබෙන කුසලතා ඔප් නංවා ගනිමින් සමාජ මෙහෙවරක යෙදීමට ක්‍රියා කිරීමත් උන් වහන්සේ වෙනුවෙන් දැක්විය හැකි ශ්‍රේෂ්ඨතම උපහාරය යි.

**අරුත් පැහැදිලි කිරීම**

| | |
|---|---|
| අචකිත | - චකිතයකින් තොරව/නිසැක |
| අභීත | - බිය නැති |
| අනතිමානි | - අතිමානි නොවන/නිරහංකාර |
| පරාර්ථ චර්යාව | - අනුන්ගේ යහපත පිණිස හැසිරීම |
| ඉන්ද්‍රඛීලයක් | - නො සෙල්වෙන ශක්තිමත් කණුවක් |
| තීක්ෂ්ණ | - තියුණු |
| ප්‍රදීපස්තම්භයක් | - පහන්ටැඹක් |
| ස්ථානෝචිත ප්‍රඥාව | - තැනට සුදුසු නුවණ |
| සමයාන්තර දැනුමෙන් | - අන්‍ය ආගම් පිළිබඳ දැනුමෙන් |

## අවබෝධය

1. **මොහාට්ටිවත්තේ ගුණානන්ද හිමියන් තුළ සහජයෙන් පිහිටි විශේෂ කුසලතාව කුමක් ද?**
2. **ඕල්කට්තුමාගේ ලංකාගමනයට හේතු වූ වාදය නම් කරන්න.**
3. **බෝධිරාජ සමිතියෙන් සිදු වූ සුවිශේෂ සේවාව පැහැදිලි කරන්න.**
4. **ගුණානන්ද හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණු පංච මහා වාද නම් කරන්න.**
5. **ගුණානන්ද හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලැයිස්තුගත කරන්න.**



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ප්‍රායෝගික අභ්‍යාස

1. වාදීහසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් පිළිබඳ ජීවදත්ත පත්‍රිකාවක් පිළියෙල කරන්න.
2. බොදු පුනරුදයේ සෙන්පතියාණෝ යන මාතෘකාව යටතේ සාහිත්‍ය සමිතියේ දී කතාවක් ඉදිරිපත් කරන්න.
3. සමාජ වෙනස්වීම්වලට අනුරූපව බෞද්ධ භික්ෂූන් වහන්සේ වෙනස් විය යුතු ය/ වෙනස් නො විය යුතු ය යන්න මාතෘකා කොට ගෙන විවාදයක් සූදානම් කරන්න.
4. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ගේ චරිතය පිළිබඳ ලියවී ඇති පොත පත කියවන්න.

# රචනා ලිවීම

චරිත කතා පදනම් කොට රචනා ලිවීමේ දී නිශ්චිතව කරුණු දැක්වීම අත්‍යවශ්‍ය ය. සමාජ යහපත උදෙසා කැප වුණු උදාර චරිත මාතෘකා කර ගැනීම උචිත ය. එවැනි චරිත පිළිබඳ රචනා ලිවීමේ දී පෞද්ගලිකත්වයට වඩා ජාතික, ආගමික හා සමාජීය මෙහෙවර ඇගයිය යුතු ය. පෞද්ගලික ජීවන තොරතුරු විශේෂයෙන් මතු කළ යුත්තේ සමාජ මෙහෙවර සඳහා ඒවා හේතු වන්නේ නම් පමණි. මාතෘකාගත චරිතය නිර්මාණශීලි ලෙස වර්ණනා කරද්දී අතිශයෝක්තියට නො නැංවීමට වග බලා ගත යුතු ය.

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200ක් පමණ වන සේ රචනාවක් ලියන්න.

   හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
   හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා
   ශ්‍රීමත් ආතර් සී ක්ලාක් මහතා
   දුටුගැමුණු රජතුමා
   අනගාරික ධර්මපාල තුමා

2. **පහත දැක්වෙනුයේ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ජීවිතය හා ග්‍රන්ථකරණය සම්බන්ධ තොරතුරු ස්වල්පයකි. එය ඇසුරු කර ගනිමින් “හෙළයේ මහා ගත්කරු” යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.**

**ජීවන තොරතුරු**

1890 මැයි 39 කොග්ගල මලලගම දී උපත සිදු වීම
පියා ළමාහේවාගේ දොන් බස්තියන් වික්‍රමසිංහ මහතා ය
මව ලියනගේ නොච්චිහාමි මැතිනිය යි
1900 ගාල්ලේ බොනවිස්ටා පාසලට ඇතුළත් වීම
1902 පියාගේ අභාවය නිසා ඇති වූ ආර්ථික අපහසුතා හේතුවෙන් පාසලෙන් ඉවත් වීම
1903 කොග්ගල ධීරානන්ද හිමියන් වෙතින් සිංහල, පාලි, සංස්කෘත උගනිමින් සිටිය දී **බාලෝපදේශය** නැමති ප්‍රථම ග්‍රන්ථය පළ කිරීම
1904 අහංගම සිංහල පාසලට ඇතුළත් වීම
1906 දී පාසලෙන් ඉවත්ව ලියන්නකු වශයෙන් රැකියාවට යෑම
1914 දී තමාගේ ප්‍රථම නවකතාව වශයෙන් ලීලා පළ කිරීම
1920 දිනමිණ පුවත්පතෙහි සේවයට එක් වීම
1925 විවාහ වීම
1946 වෘත්තීය ලේඛකයකු ලෙස කටයුතු ආරම්භ කිරීම
1953 දී දෙවන එලිසබෙත් මහරැජන විසින් එම්. බී. ඊ. ගෞරව නාමය පිරිනැමීම
1956 දී **විරාගය** නවකතාවට දොන් පේද්‍රික් සම්මානය ලැබීම හා ලද තෑගි මුදල ශිෂ්‍යත්වයක් සඳහා පිරිනමන ලදි
1958 සෝවියට් සංගමයේ ඇරයුම පිළිගෙන රුසියාවේ සංචාරය කිරීම
1959 දී මහජන චීනයේ දස වැනි සංවත්සරයට ආරාධිත අමුත්තකු ලෙස සහභාගි වීම
1961 දී තාගෝර් ශතසංවත්සර උලෙළට ඇරයුම් ලබා ඉන්දියාවට යෑම

**ග්‍රන්ථකරණය**

ළමා සාහිත්‍යය - බාලෝපදේශය, දඬුමොනරය, ගලිවරායනය, රජ වෙන්ට ගිය මහන්නා ආදිය
නවකතා - ලීලා, ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය, විරාගය, බව තරණය ආදිය
කෙටිකතා - ගැහැනියක්, පව්කාරයාට ගල්ගැසීම, වහල්ලු ආදිය
විචාර ග්‍රන්ථ - ගුත්තිල ගීතය, සාහිත්‍ය කලාව, සිංහල සාහිත්‍යයේ නැගීම, සිංහල විචාර මග
ජීව විද්‍යාව - කුරුමිණි සත්තු, කුරා කුහුඹු සත්තු, වෙස් මාරු කරන සත්තු, විද්‍යා විනෝද කතා
අතිරේක කියවීම් පොත් - සදාචාරය හා නිරෝගී සම්පත, පළාත් ආණ්ඩුව, ප්‍රජාපාලන ශික්ෂා
දර්ශනය හා වෙනත් - සිංහල ලකුණ, බුදුසමය හා සමාජ දර්ශනය, දැනුම හා දැකුම, සෝවියට් දේශයේ නැගීම ආදි


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# පද බෙදීම

ලියා දැක්වීමේ දී නිවැරදිව අර්ථ ප්‍රකට වන පරිදි පද වෙන් කළ යුතු ය. පහත දැක්වෙනුයේ සංඛ්‍යාවාචි පද ලියා දැක්වීමේ සම්මත පිළිවෙළ යි.

## සංඛ්‍යා වචනයෙන් ලිවීම

සියයෙන් පහළ සංඛ්‍යා එක් කොට හෝ වෙන් කොට හෝ සමරූපතාවෙන් (එක් ලේඛනයක දී සැම තැන්හි ම එක් ක්‍රමයක් අනුව) ලිවීම.

දහඅට, දහ අට විසිපහ, විසි පහ

සියයෙන් ඉහළ සංඛ්‍යා ලිවීමේ දී සිය, දහස්, ලක්ෂ, කෝටි, මිලියන, බිලියන, ට්‍රිලියන ආදි සංඛ්‍යාර්ථවත් වචනයක් ඊට පූර්වයෙන් යෙදෙන සියයට අඩු සංඛ්‍යා වචනයට එක් කොට හෝ වෙන් කොට හෝ සමරූපතාවෙන් ලිවීම.

අටදහස් හයසිය විසිපහ, අට දහස් හය සිය විසි පහ
දහඅටදහස් හයසිය විසිපහ, දහ අට දහස් හය සිය විසි පහ
එක්ලක්ෂ දහඅටදහස් හයසිය විසිපහ, එක් ලක්ෂ දහ අට දහස් හය සිය විසි පහ

## සංඛ්‍යා ඉලක්කමෙන් ලියා දැක්වීම

ඉලක්කමෙන් සංඛ්‍යා දැක්වීමේ දී විභක්තිය දැක්වීම පිණිස යොදන අකුරු එම සංඛ්‍යාව සමග එක් කොට ලිවීම

10ක් 49කට 75කින් 100ට 50න්